සූරිය මණ්ඩල සේමා

සිංහල අළුත් අවුරුදු කාලයට කවුරුන්ට වුණත් තම තමන්ගේ ගම් රටවල් නෑ සියන් මතක් වෙන එක අහන්න දෙයක් නෙවෙයි. අවුරුදු කාලයට සෑම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක්ම උනන්දු වෙන්නෙ සිංහල කමට, ගැමි සිරිත් විරිත් වලට මුල් තැනක් දෙන්න. මෑත යුගයේ ලංකාවේ ප්‍රවණතාවක් වෙලා තියෙන ගී ආරක් අනුව නිර්මාණය වුණ ගීයක පසුබිමයි අද අවධානයට ලක් වෙන්නෙ. ජන ගී වන්නම්, ජනකවි, සවිදම් තාල මුහු කරගෙන නිර්මාණය වුණ තනු වලට සිංහල ගැමි වචන එක්කරමින් කළ අගේ ඇති ගී පෙළක නිර්මාණ කරුවා යි ලයනල් රන්වල ගුරුතුමා. තනුවට ගැලපෙන සංගීත නිර්මාණය කිරීමේ දී සිංහල කම නැංවෙන රිද්මය මුහු කරන්නට බෙර යොදා ගැනීමට රන්වල මහත්මයා උනන්දු වුණා. ඒ වගේම බෙර පද තානම්, වන්ම්, සවිදම් ගැන කියනකොට ඒ නම්නම ඇරඹෙන පද රචනාවක් සිහිපත් වෙනවා. අවුරුදු ගීයක් නිසා ඒ ගැන යමක් කතා කිරීමත් කාලෝචිතයි.

ජන ගී ඇසුරින් පර්යේෂණාත්මකව නිර්මාණය කළ ගම අවුලසඳ්සඳං ගී එකතු එළි දැක්වීම වෙනුවෙන් නිකුත් කෙරුණ සමරු කලාපයට වන්නම් සවිදම් ගායන සින්දුව රචනා කළ ආචාර්ය අජන්තා රණසිංහ මහත්මයා මෙන්න මෙහෙම කියලා තියෙනවා.

මෙය සිදු වූ අවුරුද්ද මට මතක නැහැ. ඒ අනූව දශකයේ අග භාගයේ කිසියම් දිනයක් විය. අපි ලයනල් රන්වල සහ මම බොරැල්ලේ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ මධ්‍යස්ථානයේ දී මොනිකා රුවන් පතිරණ ගේ ඇරයුමෙන් දේශණා දෙකක් පැවැත්වීමට නියමිතව සිට එහි දී හමුවුණොමු. රන්වල සහ මම කුඩා කල සිට ම ඔවුනොවුන් ව හමුවන අය වීමු. දේශණ අවසානයේ ලයනල් මට ඇරයුමක් කළේ ය.

ජන ගී ආරෙන් නිර්මාණය කළ මගේ තනුවක් තියෙනවා.. ඒකට සින්දුවක් ලියන්න මා දන්නා සුදුස්සා උඹයි...

මම එකඟ වීමි. දින කීපයකට පසු මට ඔහුගේ තනුව පටිගත කරන ලද කැසට් පටය ලබා දුන්නේ ය.



වන්නම් සවිදම් ගායන සූරිය මණ්ඩල සේමා යනුවෙන් ඇරඹෙන ගීතය මම ඔහුට රචනා කර දුනිමි. මේ ගීතයට මගේ ගැමි ජීවිතය හා බැඳුණු සිංහල අවුරුදු ගුණ සුවඳ අන්තර්ගත වූයේ එම රිද්මයට එබඳු පද ඇතුලත් කිරීමක් අවශ්‍ය යයි මට හැඟුණ බැවිණි. ලයනල් රන්වල නම් මගේ මිතුරා මගේ ගීත රචනය පිළිබඳව සෑහීමකට පත්වීණැයි ඔහු එය ගයමින් රැගෙන ගිය කෘප්තිමත් විලාශයෙන් මම සිතුවෙමි..

මොණරාගල ඇම්බුං කවි ගැයෙන නාද රටා මුල් කරගෙන නිර්මාණය වුණ තනුවේ හඳුන්වාදේමේ මුල් වාදනය පටන් ගැනෙන්නේ රබන් පදයක් වැයීමෙන්. ඒ අතරින් මතු වන තම්මැට්ටම් සුරල් පදය උඩැක්කියට මාරු වෙන කල්ම වාදනය වෙන්නෙ තාල වාදන මෙවලම් විතරයි. බටනලාව වයලින වගේ භාණ්ඩ වලට අමතරව ගිටාරයත් ජලරංගත් වෙනමම හැඩවෙන්නේ අපූරු තැවුම් සුන්දරත්වයක් නංවමින්. අවුරුදු වැඩ සටහන් වල තේමා සංගීතයට මේ සංගීත කොටස් සුලභව යොදා ගැනීමෙන්ම ඒවායේ මිහිරියාව ගැන හිතාගන්න පුලුවන්. පිරිස් එක්වෙලා රැයෙයන කාන්තා කට හඬවල් වගේම පිරිමි කටහඬවල් සංගීතයට අත්වැල් දෙනවා.

හොයි.. වගේ ශබ්ද පිරිමි හඬින් ගායනා කරවීමෙන් ගීයට අමුතු කෙළිලොල් බවක් එක් කරනවා. දෘෂ්‍ය මාධ්‍ය තුළින් හා වේදිකාව මතින් කෙරෙන අපූරු රංගනයත් ගැමි හඬ මුහු වුණ ගායනයත් සෑම අවුරුදු කාලයකම දෝංකාර දෙන්නේ හිතට මහා දුකක් ගෙන එමින්. මීට අවුරුදු කීපයකට පෙර වියෝ වුණ ලයනල් රංවල සර් මතක් වෙලායි ඒ.

වන්නම් සවිදම් ගායන
සූරිය මණ්ඩල සේමා
ගයමුව යාළුව මා හා
ඉහළ ගමෙන් - කෝ වරෙල්ලා
වරෙල්ලා යාළු පනේ
පෙහෙරැස් මුදුවේ - බලල්ලා
බලල්ලා දිස්නෙ නගෝ

රෑ රෑ කැත්ත දො දොං
පිලවත්තේ බං

පිල වට කරලා කැත්ත දො දොං දොං
රබාන ගාන් - රත් කරගාන්
පච්ච වඩම් පාටින් සරොන් ඇඳින්සඳ්සඳං
මං

සට පට කම්බා උඹත් ඇඳිසඳ්සඳයි
සට පට ගා හඬ වැඩ දා
රන් ඔන්චිල්ලාවෙන් ආකාසෙට යාසඳ්සඳයි

රචනය
ආචාර්ය අජන්තා රණසිංහ